**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | | එකතු වටිනාකම රු.1,684,780 ක් වූ වසර 02කට වැඩි කාලයක් පවතින ටෙන්ඩර් තැන්පතු හා රඳවා ගැනීමේ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් කමිටු නිර්දේශ පරිදි ආදායමට ගැනීමටත්, අලාභ පියවා ගැනීමටත්, අදාළ පරිදි අවශ්‍යතාවය මත තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාමටත් කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හා මුදල් රෙගුලාසි 371(2) | (i) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි උපරිම සීමාව ඉක්මවා අවස්ථා දෙකකදී එකතුව රු.345,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | මුදල් කමිටුව මගින් හා උපකුලපතිගේ විශේෂ අනුමැතියද ලබාගෙන ඇති බව එමෙන්ම ඇස්තමේන්තු මත කෙරෙන ඇතැම් කාර්යයන් සිදු නොකෙරුන අවස්ථා අනුව අත්තිකාරම් ඉතිරිවීම් ඇතිවී තිබුණු අතර, ප්‍රමාදයකින් තොරව පියවා ඇති බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| | | (ii) | නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව අවස්ථා 17 කදී ලබාදී තිබුණු රු.798,340 ක අත්තිකාරම් වලින් සියයට 43 සිට සියයට 83 දක්වා ඉතිරිවීම් පැවතුණු අතර අවස්ථා 14 කදී ලබාදෙන ලද රු.599,350 ක අත්තිකාරම් අදාළ කාර්යයන් සිදුනොකර මුළු මුදලම ආපසු පියවා තිබුණි. | | |

## 1.6 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ පංචකර්ම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර ගැනීම සඳහා 2005 වර්ෂයේදී ලැබී තිබුණු රු.250,000 ක පරිත්‍යාග මුදල අදාළ අරමුණ වෙනුවෙන් යොදා ගැනීමකින් තොරව 2005 නොවැම්බර් 30 දින සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රු.1,070,927 වී තිබුණි. | පංචකර්ම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කාර්ය එම වර්ෂවලදීම සිදුකර ඇති අතර එම අළුත්වැඩියාව සඳහා මෙම මුදල් භාවිතයට ගැනීමට අවශ්‍යතාවයක් නොමැතිවූ බව. | ලබාදී ඇති මුදල් අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.48,773,516 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.161,849,926 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.113,076,410 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා වේතන වියදම රු.112,574,488 කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොතිබීම හේතුවෙන් දේශීය වෛද්‍ය සම්පත් දෙපාර්තමේන්තුව සඳහා 2022 ජූනි 15 දින සිට මාසයකට රු.550,000 බැගින් වර්ෂ 02ක කල්බදු පදනමට යක්කල පාරේ ගොඩනැගිලි පරිශ්‍රයක් ලබා ගෙන තිබුණු අතර එය භාවිතයට සුදුසු තත්ත්වයට පත්කර ගැනීමට අමතර ඉදිකිරීම් හා වැඩ සඳහා රු.8,817,467ක් වැනි විශාල මුදලක් වැය කර තිබුණි. එමෙන්ම සමාජවිද්‍යා අධ්‍යනාංශය හා කළමනාකරණ අධ්‍යනාංශය සඳහා මාසයකට රු.750,000 ක කුලියට 2022 ජනවාරි 01 දින සිට වර්ෂ 03ක් සඳහා මොරටුව ප්‍රදේශයෙන් ගොඩනැගිලි කුලියට ලබාගෙන තිබුණද එය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සිට කි.මී 50කට වැඩි දුරකින් පිහිටා තිබුණු අතර කළමනාකරණ අධ්‍යයනාංශය සඳහා වන | ගම්පහ යක්කල පාරේ ගොඩනැගිල්ල කල්බදු පදනමට ලබාගෙන විශ්වවිද්‍යාලයට අවශ්‍ය කටයුතු පවත්වාගෙන යාමට හැකි පරිදි සකස්කර ගන්නා ලද බව.<br><br>එමෙන්ම බණ්ඩාරගම ආලෝකවත්ත ස්ථානයේ සමාජවිද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය පිහිටුවා ඇති අතර උපාධි පාඨමාලා කටයුතු සඳහා ඉතාමත් සුදුසු පරිසරයක මෙම පීඨය ස්ථාපිත කර ඇති බව. | පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර පාඨමාලා කටයුතු විධිමත්ව ආරම්භ කර පවත්වාගෙන යා යුතුය. |

පාඨමාලා ආරම්භ කිරීම 2022 දෙසැම්බර් 31 දින දක්වාම සිදුවී නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් සැලසුමකින් තොරව අධ්‍යයන කාර්යමණ්ඩලයට නිවාඩු ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් මඟින් දේශන ආවරණය කර ගෙන රු.840,675 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | සමහර උපාධි පාඨමාලා සඳහා පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම ලබාගත යුතුව ඇති බැවින් ඔවුන්ගේ දැනුම ලබාගන්නේ බාහිර කථිකාචාර්ය සේවාව මඟින් බව. විශ්වවිද්‍යාල තත්ත්වයට උසස්වීමෙන් පසුව අවශ්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවුනු බැවින් බාහිර පදනමින් ලබා ගැනීමට කටයුතු කළ බව. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවාව උපරිමයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වතුපිටිවල මාතලානේ පිහිටි හෙක්ටයාර් 2.3533 ක භූමි ප්‍රමාණයකින් යුතු ඖෂධ උද්‍යානය විශ්වවිද්‍යාලය වෙත නිදහස් දීමනාවකින් 2013 ජූලි 31 වන දින පවරා දී තිබූ අතර එම උද්‍යානයේ පවතින ඖෂධ පැළෑටි හා වෘක්ෂලතා ආදිය පිළිබඳ විධිමත් සංගණනයක් සිදුකර ඒවායේ පිහිටීම් දැක්වෙන වාර්තාකරණයක් පවත්වා ගැනීමද සිදුකර නොතිබුණි. එසේම එම උද්‍යානය ආයතනයේ අරමුණු සඳහා උපයෝගී කර ගැනීම සහ උද්‍යානයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට වාර්තාවේ දින දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම උද්‍යානය ආයතනයේ අරමුණු සඳහා උපයෝජනය කරගැනීමේ අරමුණින් සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතිය පරිදි එම පරිශ්‍රයේ පටක රෝපණ විද්‍යාගාරය (Tissue Culture Lab) සකස් කිරීම සඳහා අදාළ පිරිවිතරයන්ට අනුව සැලැස්මක් සකස් කර ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව. | විධිමත් සැලැස්මක් සකස්කර ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඉටුකර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 77 න් ක්‍රියාකාරකම් 14 ක් වර්ෂය තුළ ආරම්භ කර නොතිබූ අතර ක්‍රියාකාරකම් 48 ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2021 සහ 2022 රට තුළ පැවති අස්ථාවරතාවයන් හේතුවෙන් සැලසුම්කළ පරිදි කටයුතු ඉටුකර ගැනීමට නොහැකිවූ බව. | සැලසුම්කළ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට ක්‍රියාකළ යුතුය. |